ඇමුණුම 1

**ජාතික සවිබල ගැන්වීමේ වැඩසටහන**
**සහභාගිවන්නන් තෝරා ගැනීමේ මාර්ගෝපදේශය**

1.1. පසුබිම:

සවිබල ගැන්වීමේ වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (ස.සං.දෙ) විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා තෝරාගත් දිළිඳු සහ දැඩි දිළිඳු *අස්වැසුම* ප්‍රතිලාභීන්ගේ සමාජ ආර්ථික සවිබල ගැන්වීම සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම සවිබල ගැන්වීමේ වැඩසටහනේ යටතේ ක්‍රියාත්මක නියමු වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 13ක් තුළ ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 64 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 400ක් තුළ ජීවත්වන දැඩි දිළිඳු සහ දිළිඳු *අස්වැසුම* ප්‍රතිලාභීන් 12,800 ක් ආවරණය කිරීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි. නියමු වැඩසටහන මාස 24ක් පුරා ක්‍රියාත්මක කෙරේ. එයට සමාජ ආරක්ෂණය, මූල්‍ය අන්තර්කරණය, ජීවනෝපාය ප්‍රවර්ධනය, මනෝ සමාජීය සවිබල ගැන්වීම සහ පුහුණු කිරීම සහ උපදේශනය යන මූලික අංශ පහට අයත් ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

පහත සඳහන් නිර්ණායක 04 භාවිතා කරමින් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සමාජ ලේඛනය (අස්වැසුම ලැයිස්තුව) හරහා සෑම ග්‍රාම නිලධාරී වසමකම සුදුසුකම් ලත් සහභාගිවන්නන් හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ:

1. සහභාගිවන්නන් මෙම නියමු වැඩසටහන සඳහා තෝරා ගෙන ඇති ග්‍රාම නිලධාරී වසම් 400ක් අතරින් එක් වසමකට අයත් වීම:
2. සහභාගිවන්නන් *අස්වැසුම* ලැයිස්තුවට අනුව දැඩි දිළිඳු හෝ දිළිඳු කාණ්ඩයකට අයත් වීම:
3. අවම වශයෙන් වයස අවුරුදු 18 ත් 55 ත් අතර වයස් කාණ්ඩයට අයත් ක්‍රියාකාරී එක් ගෘහ සාමාජිකයෙක් සිටීම.
4. සහභාගිවන්නන් *අස්වැසුම* ලැයිස්තුව මත පදනම්ව තමා අයත් ග්‍රාම නිලධාරී වසමෙහි ඉහළම දරිද්‍රතා ලකුණු ඇති නිවාස ඒකක 50 ලැයිස්තුවට ඇතුලත් වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉහත නිර්ණායක සපුරාලන සුදුසුකම් ලත් නිවාස ඒකක සම්බන්ධව මූලික සමීක්ෂණයක් පවත්වන ලදී. ඒ එක් එක් ග්‍රාම නිලධාරී වසමකින් *අස්වැසුම* ප්‍රතිලාභීන් 32ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මූලික නියමු වැඩසටහනට සහභාගී වීම සඳහා තෝරා ගනු ලැබේ. නියමු වැඩසටහන සඳහා අවසාන ප්‍රතිලාභීන් තෝරා ගැනීම පහත මාර්ගෝපදේශ අනුගමනය කරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් සිදු කෙරෙන අතර, එය අහඹු ලෙස තෝරා ගැනීම මත පදනම් වේ.

1.2. මෙම අභ්‍යාසයේ අරමුණු:

- ජාතික සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා තෝරාගත් සහභාගිවන්නන් අවසාන ලැයිස්තුව සම්පාදනය කර එම ලැයිස්තුව තෝරාගත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ වෙත යොමු කිරීම.
- මීළඟ පියවර සමෘද්ධි සංවර්ධන නිලධාරිවරුන් සඳහා අදාළ වන අතර, සමෘද්ධි කළමනාකරුවන්ගේ සහ ප්‍රාදේශීය ලේකම්ගේ සහාය ඇතිව, තෝරාගත් සහභාගිවන්නන් අතර දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වීමට කටයුතු කළ යුතු අතර එම සැසියේ දී:
  - වැඩසටහන පිළිබඳ හඳුන්වා දීමට:
  - වැඩසටහනට සම්බන්ධ වන සහභාගිවන්නන්ට ඔවුන්ගේ වගකීම් පිලිබඳ පැහැදිලි කිරීම:
  - අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මගින් තෝරාගත් ප්‍රතිලාභීන් වැඩසටහනට නිල වශයෙන් ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතු ය.

1.3. සහභාගිවන්නන් අහඹු ලෙස තෝරා ගැනීම යන්න අර්ථ දැක්වීම:

කිසියම් ජනගහනයක් අතුරින් සුදුසුකම් ලත් සාමාජිකයන් පිරිසක් තෝරා ගැනීමේ දී, ජනගහනයේ සෑම සාමාජිකයෙකුටම තෝරා ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමට සමාන අවස්ථාවක් හිමිවන ක්‍රමවේදය අහඹු තේරීම යනුවෙන් හැඳින්වේ. තෝරාගත් නියැදිය මුළු ජනගහනයම නියෝජනය කරන බව සහතික

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

කිරීමට මෙය උපකාරී වන අතර වැඩසටහන සඳහා අවස්ථාව හිමිවන පුද්ගලයන් අවස්ථාව හිමි නොවන පුද්ගලයන් සමඟ සංසන්දනය කිරීමෙන් බලපෑම තක්සේරු කළ හැකිය. අහඹු තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී පක්ෂග්‍රාහී වීමට ඇති සියළු අවදානම් අඩු කරයි. සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාවට නන්වන්නන් සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම අහඹු තේරීම් ක්‍රියාවලිය හරහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත. අහඹු ලෙස තෝරා ගැනීම සසම්භාවී අංක උත්පාදක යන්ත්‍ර, ලොතරැයි යන්ත්‍ර හෝ පරිගණක මෘදුකාංග වැනි විවිධ මෙවලම් භාවිතයෙන් සිදු කළ හැකිය. මෙම නියැදි තෝරා ගැනීමේ දී Microsoft Excel මත සාදන ලද පරිසනක මෘදුකාගයක් භාවිතා කරනු ඇත.

**1.4.** අවශ්‍ය ද්‍රව්‍ය :

- සවි බලගැන්වීමේ වැඩසටහන සම්බන්ධයෙන් අමතර තොරතුරු සඳහා වැඩසටහන් අත් පත්‍රිකාව.
- අදාළ දිස්ත්‍රික්කය තුළ නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස තෝරාගත් ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙතින් සුදුසුකම් ලත් සියලුම අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ගෘහ හැඳුනුම්පත් අංකය.
- වෙබ් අඩවියක් විවෘත කිරීම උදෙසා අන්තර්ජාලයට පිවිසීමේ හැකියාව සහිත මයික්‍රෝසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය ස්ථාපනය කර ඇති පරිගණකයක්.
- ඉලක්කගත නියැදි ප්‍රමාණය, තෝරාගත යුතු සහභාගිවන්නන් සංඛ්‍යාව මෙයින් අදහස් වේ:
    - <u>**කාණ්ඩය 1:**</u> සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමීක්ෂණය කරන ලද සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් 50ක් සහිත ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා:
        - නියමු වැඩසටහන සඳහා සහභාගිවන්නන් 32ක් තෝරා ගනු ලැබේ
        - තෝරාගත් සහභාගිවන්නන් 32 දෙනා අතරින් කිසිවෙකු හෝ වැඩසටහනට සහභාගී වීම ප්‍රතික්ෂේප කළහොත් ඒ වෙනුවට ආදේශ කිරීම පිණිස ප්‍රතිලාභීන් 3දෙනෙකු ආදේශක කණ්ඩායමේ සිටිය යුතු ය.
        - ප්‍රතිලාභීන් 15 දෙනෙකු පාලක කණ්ඩායමට ඇතුළත් වන අතර ඔවුන් වැඩසටහන සඳහා තෝරා ගනු නොලැබේ.
        - එබැවින්, තෝරා ගැනීම සඳහා ඉලක්කගත නියැදි ප්‍රමාණය 32 කි.
    - <u>**කාණ්ඩය 2:**</u> සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමීක්ෂණය කරන ලද සුදුසුකම් ලත් සහභාගිවන්නන් 35 - 49ක් සහිත ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා:
        - නියමු වැඩසටහන සඳහා සහභාගිවන්නන් 32ක් තෝරා ගනු ලැබේ
        - තෝරාගත් සහභාගිවන්නන් 32 දෙනා අතරින් කිසිවෙකු හෝ වැඩසටහනට සහභාගී වීම ප්‍රතික්ෂේප කළහොත් ඒ වෙනුවට ආදේශ කිරීම පිණිස ප්‍රතිලාභීන් 3 දෙනෙකු ආදේශක කණ්ඩායමේ සිටිය යුතු ය.
        - ප්‍රතිලාභීන් 14 දෙනෙකු පාලක කණ්ඩායමට ඇතුළත් වන අතර ඔවුන් වැඩසටහන සඳහා තෝරා ගනු නොලැබේ.
        - එබැවින්, තෝරා ගැනීම සඳහා ඉලක්කගත නියැදි ප්‍රමාණය නැවත වරක් 32 කි.
    - <u>**කාණ්ඩය 3:**</u> සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමීක්ෂණය කරන ලද සුදුසුකම් ලත් සහභාගිවන්නන් 35ට අඩු ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා:
        - නියමු වැඩසටහන සඳහා සහභාගිවන්නන් 32 ක් තෝරාගනු ලැබේ.
        - තෝරාගත් සහභාගිවන්නන් 32 දෙනා අතරින් කිසිවෙකු හෝ වැඩසටහනට සහභාගී වීම ප්‍රතික්ෂේප කළහොත් ඒ වෙනුවට ආදේශ කිරීම පිණිස සහභාගිවන්නන් 1හෝ2 දෙනෙකු ආදේශක කණ්ඩායමේ සිටිය යුතු ය.
        - මෙම පියවරයේ දී පාලක කාණ්ඩායමක් ඇතුල්ත් නොවේ.
        - එබැවින්, ඉලක්කගත නියැදි ප්‍රමාණය වනුයේ සමීක්ෂණය කරන ලද නිවාස ඒකක සංඛ්‍යාව එනම් 35ට අඩු සංඛ්‍යාවකි.

**1.5.** කාලය: ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් සඳහා මිනිත්තු 15-20

**1.6.** සහභාගිවන්නන් තෝරා ගැනීම පිණිස:

තෝරා ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටුවක් පත් කරනු ලබන අතර එය පහත සඳහන් සමාජිකයන්ගෙන් සමන්විත වේ:

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

- දිස්ත්‍රික් ලේකම්වරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
- දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා
- දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ සහකාර අධ්‍යක්ෂවරයා
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශිය ලේකම් වරයා හා ඔහු විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක්
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සම්බන්ධිකරණ සමෘද්ධි කළමනාකරු
- මෙම ප්‍රතිලාභින් එක්සෙල් මෘදුකාංගය ( Excel Software) භාවිතයෙන් තෝරාගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් තොරතුරු තාක්ෂණ නිලධාරිවරයා.
- මෙම ක්‍රියාවලියට සහායවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණික උපදේශකවරයා

මෙම තෝරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියා සහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා යන දෙදෙනාම පැමිණ සිටිය යුතුය

1.7. තෝරා ගැනීමේ කාර්යය පටිපාටිය:

1. දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ නිලධාරියා සහ ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරුවන් විසින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සහ එක්සෙල් මෘදුකාංගය මඟින් සිදු කළ යුතු කාර්යයන් පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණික උපදේශකවරයා වෙතින් රැස්වීමට පෙර පුහුණුව ලබා ගත යුතුය.
2. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් ඔවුන්ගේ දිස්ත්‍රික්කය යටතේ මෙම නියමු ව්‍යාපෘතිය සඳහා සමීක්ෂණය කරන ලද ග්‍රාම නිලධාරී වසම් අනුව සුදුසුකම් ලත් සියලුම අස්වසුම ප්‍රතිලාභීන් සඳහා ගෘහ හැඳුනුම්පත් ලැයිස්තුව සම්පාදනය කළ යුතුය.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා විසින් දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ සම්බන්ධීකරණය වෙමින් සහභාගීවන්නන් තෝරා ගැනීම උදෙසා රැස්වීමක් පැවැත්වීමට සුදුසු වේලාවක් වෙන් කල යුතු අතර තෝරාගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලු දෑ සූදානම් බවට රැස්වීමට පෙර සහතික විය යුතුය.
4. කම්වූ රැස්වීම අතරතුර තෝරා ගැනීම සිදු වන්නේ කෙසේද යන්න පිළිබඳ සාරාංශයක් ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික උපදේශකවරයා විසින් සපයනු ඇත. සසම්භාවී ක්‍රියාවලිය යොදා ගත හැක්කේ එක් වරක් පමණක් බව සැලකිල්ලට ගැනීම මෙහි දී වැදගත් වේ.
5. දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ, මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි අහඹු තේරීමක් සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරියා එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසය සඳහා පහත පියවර අනුගමනය කරනු ඇත:

   a. ආසියානු සංවර්ධන බැංකුවේ නියැදි තෝරාගැනීමේ වැඩපොත විවෘත කර Enable <u>Macros</u> සක්‍රිය කරන්න.

   b. සුදුසුකම්ලත් සහභාගිවන්නන්ගේ ගෘහ හැඳුනුම්පත් අංක ලැයිස්තුව එයට ඇතුළත් කරන්න. සහභාගිවන්නන්ගේ මුළු සංඛ්‍යාව දකුණු පස ඇති "නිවාස හැඳුනුම්පත් අංක" හා සමාන බව තහවුරු කරන්න.

   c. දැන් ***<u>සහභාගිවන්නන් තෝරන්න</u>*** බොත්තම ක්ලික් කරන්න. මෙය අහඹු ලෙස ග්‍රාම නිලධාරී වසම් හි සම්පූර්ණ සහභාගිවන්නන් ඉහත සඳහන් කළ කාණ්ඩ මත පදනම්ව ප්‍රතිකාර, ප්‍රතිස්ථාපන සහ පාලන කණ්ඩායම්වලට වෙන් කරනු ඇත. **<u>මෙම පියවර සිදු කළ හැක්කේ එක් වරක් පමණි.</u>**

   d. එම ග්‍රාම නිලධාරී වසමේ හි ප්‍රතිකාර කණ්ඩායම, ප්‍රතිස්ථාපන කණ්ඩායම සහ පාලන කණ්ඩායම යටතේ තෝරාගත් ***<u>සහභාගිවන්නන්</u>*** සඳහන් කිරීමට - තෝරාගත් පේළි දකුණු පස සිට නව වැඩ පත්‍රිකාවකට හෝ ලේඛනයකට පිටපත් කර ගන්න.

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

e. එම දිස්ත්‍රික්කයේ සියලුම ග්‍රාම නිලධාරී වසම් සඳහා එකම අභ්‍යාසය නැවත කරන්න. මීළඟ ග්‍රාම නිලධාරී වසම සඳහා මෙම අභ්‍යාසය පැවැත්වීම සඳහා, "ගෘහස්ථ හැඳුනුම්පත" සහ "අනුපිළිවෙල #" යන තීරුවල ඇති සියලුම ඇතුළත් කිරීම් මකන්න. එය මීළඟ ග්‍රාම නිලධාරී වසම සඳහා තේරීමට මෙවලම නැවත සකසනු ඇත.

<u>සටහන:</u> ඔබ වෙනත් තීරුවක් ක්ලික් කළහොත් හෝ මකා දැමුවහොත්, එය දෝෂයක් ඇති කරයි. එමනිසා, ඔබට අවශ්‍ය වන්නේ ගෘහ හැඳුනුම්පත සහ අනුක්‍රමය # තීරු තුළ ඇතුළත් කිරීම් පමණක් මකා දැමීමයි, එවිට ඔබට ඊළඟ ග්‍රාම නිලධාරී වසම සඳහා ගෘහ හැඳුනුම්පත් ඇතුලත් හැක.

1.8. තෝරා ගැනීමෙන් පසු සිදු කෙරෙන ක්‍රියාවලිය:

1. සහභාගිවන්නන්ගේ ලැයිස්තුව තෝරා වර්ගීකරණය කළ පසු, ග්‍රාම නිලධාරී කොට්ඨාසය අනුව තෝරා ගැනීමේ අනුපිළිවෙල පරිදි ප්‍රතිලාභීන් ලැයිස්තුගත කරනු ලැබේ.
2. කමිටුව විසින් ප්‍රතිලාභී ලැයිස්තුව සහතික කර ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය සඳහා යොමු කරනු ලබයි.
3. තෝරා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව අමතර තොරතුරු සහ සැලකිය යුතු කරුණු පවතින්නේ නම් ඒ පිළිබඳ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා විසින් ලේඛනගත කළ යුතු අතර තේරීම් කමිටු සාමාජිකයින් විසින් අත්සන් කළ යුතුය.
4. අනුමත කරන ලද ප්‍රතිලාභීන් ලැයිස්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩසටහන් තොරතුරු අත් පත්‍රිකාව සහ සහභාගිවන්නන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සමඟ ප්‍රකාශයට පත්කළ යුතුය.

1.9. නිතර අසන ප්‍රශ්න:

a. *ප්‍රශ්නය: සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා තෝරාගත් ප්‍රතිලාභීන් වෙත පැමිණ ප්‍රතිලාභීන් 32 දෙනෙකු වැඩසටහනට සම්බන්ධ කරගන්නා බවට පැවසූ පසු, ඇතැම් ප්‍රතිලාභීන් වැඩසටහනට සහභාගී වීම ප්‍රතික්ෂේප කළ විට, පාලක කණ්ඩායමට අයත් ඉතිරි ප්‍රතිලාභීන්ට මෙම අවස්ථාව පිරිනැමිය හැකිද?*

පිළිතුර: නැත, සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයාට එය පිරිනැමිය හැක්කේ එක් ග්‍රාම නිලධාරී වසමකට උපරිම වශයෙන් ප්‍රතිලාභීන් 32 දෙනෙකුට පමණක් වන අතර අවස්ථාව දීර්ඝ කල හැක්කේ ආදේශන ලැයිස්තුවෙහි නම සඳහන් සහභාගිවන්නන් දක්වා පමණි. වැඩසටහනේ ඵලදායීතාවය විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය වන බැවින් සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා එම වැඩසටහනට සහභාගී වීමේ අවස්ථාව පාලක කණ්ඩායමට අයත් නිවාස ඒකක වලට ලබා නොදිය යුතුය. තෝරාගත් කණ්ඩායමෙන් වැඩසටහනට සහභාගී වීමට කැමැත්ත පල කරන නිවාස ඒකක සංඛ්‍යාව සහ අවශ්‍ය අවස්ථාවක දී ඇතුලත් කෙරෙන ආදේශක කණ්ඩායම් ලැයිස්තුවට අයත් නිවාස ඒකක සංඛ්‍යාව ග්‍රාම නිලධාරී වසමක වැඩසටහනට සම්බන්ධ කරගනු ලබන අවසාන ප්‍රතිලාභීන් සංඛ්‍යාව වේ.

b. *ප්‍රශ්නය: අපි සුදුසුකම් ලත් සියලුම ප්‍රතිලාභීන්ට වැඩසටහනට සහභාගී වීමට අවස්ථාව ලබා නොදෙන්නේ ඇයි?*

පිළිතුර: මෙම අවස්ථාවේ දී නියමු ආයතනයට පවතින සම්පත් සීමිත වන අතර එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයකින් ප්‍රතිලාභීන් 32 කට වඩා අඩු හෝ ඊට සමාන පිරිසකට පමණක් සහාය විය හැක. එබැවින්, නියමු ආයතනය මෙම වැඩසටහන මෙම ප්‍රතිලාභීන් සංඛ්‍යාවෙන් ආරම්භ කරන අතර පසුව අදියරේ දී තවත් ප්‍රතිලාභීන් වෙත වැඩසටහන ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.

c. *ප්‍රශ්නය: අපි නිවාස ඒකක අහඹු ලෙස තෝරා ගන්නේ ඇයි? දිස්ත්‍රික් මට්ටමින් කමිටුවේ කාර්යභාරය කුමක්ද?*

පිළිතුර: නියමු ආයතනය අහඹු ලෙස නිවාස ඒකක තෝරා ගනිමින් සිටින අතර, එමඟින් සෑම සුදුසුකම් ලත් ප්‍රතිලාභියෙකුටම වැඩසටහන සඳහා තෝරා ගනු ලැබීමට සමාන අවස්ථාවක් ඇති අතර තේරීම් ක්‍රියාවලිය තුළ කිසිදු අගතියක් සිදු නොවන බව තහවුරු කරයි. දිස්ත්‍රික් මට්ටමින් කමිටුවේ කාර්යභාරය වන්නේ ක්‍රියාවලිය විෂය මූලිකව සිදු කිරීම සහ ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවට කිසිදු හානියක් සිදු නොවන බව සහතික කිරීමයි.

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

d. *ප්‍රශ්නය: දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රකාශයට පත් කෙරෙන අවසාන ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවට ඇතුළත් විය යුත්තේ කවුරුන්ද?*

පිළිතුර: එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහා අවසාන ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවට වැඩසටහනට අහඹු ලෙස තෝරාගත් ප්‍රතිලාභීන් සහ වැඩසටහනෙන් ඉවත් විය හැකි ප්‍රතිලාභීන් ආවරණය කිරීම පිණිස ආදේශක ලැයිස්තුවට නම් කර ඇති ඕනෑම ප්‍රතිලාභියෙකු ඇතුළත් වේ. මෙම වැඩසටහනෙන් පාලක කාණ්ඩායම ප්‍රතිලාභ නොලබන බැවින් අවසාන ලැයිස්තුවට (එනම් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකට) ප්‍රතිලාභීන් 15 දෙනෙකුඇතුගත් වේ.

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.